40 සිට 49 දක්වා

වගා සහනාධාර චක්‍රලේඛ අංක: 40

සියළුම ප්‍රාදේශීය කළමනාකරුවන්
ව්‍යාපාර නිලධාරී
මතුගම/කෑගල්ල.

තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ.
1993.02. 17 දින.

දලු නෙලන තේ ඉඩම්වල පාළු සැපයීමේ
<u>සහනාධාර ක්‍රමය නැවත ක්‍රියාත්මක කිරීම</u>

සාටුදායක ලෙස තේ වගාවන් පවත්වාගෙන යන ඉඩම්වල එම වගාවේ සමූහ වශයෙන් ඇති වූ පාළු සපයා ඉඩම මනා කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙන යාම පිණිස පාළු සැපයීමේ ක්‍රමය 1993 ජනවාරි මස 01 වැනි දින සිට නැවත ක්‍රියාත්මක කරනු ලැබේ.

සහනාධාර යටතේ පාළු සැපයීම සඳහා අවසර දීමේදී සහ මුදල් ගෙවීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි පහත දැක්වේ.

1. පාළු සැපයීමෙන් සතුටුදායක ලෙස සංවර්ධනය කිරීමට හැකි බීජ තේ හෝ රිකිලි තේ වගාව සහිත ඉඩම්වලට පමණක් මෙම ක්‍රමය යටතේ ආධාර කළ හැකිය. මෙහිදී දැනට ඉතිරි වී ඇති තේ පඳුරු උසස් තත්ත්වයෙන් පැවතිය යුතු අතර අවම වශයෙන් ඉදිරි අවුරුදු 10 ක කාලය තුලදී නැවත වගා කිරීමට අවශ්‍ය නොවිය යුතුය. ඉහත සුදුසුකම් සපුරාලනු නොලබන අන් සියලු තේ ඉඩම් පාළු සැපයීමට නොව නැවත වගාවට යොමු කරවා ගැනීම අවශ්‍ය වේ.

2. පාළු සහිත එක් ස්ථානයක යටත්පිරිසෙයින් පාළු පැල 25ක්(වර්ග අඩි 200ක පමණ ප්‍රමාණයේ) එක් යෙදීමට හැකි විය යුතුය. තනි තනිව හෝ එක් ස්ථානයක එකී ප්‍රමාණයට වඩා අඩුවෙන් ඇති පාළු සැපයීමට මෙම ක්‍රමය මඟින් ආධාර කළ නොහැක

3. ඉහත පිළිවෙල අනුව එක ඉඩමක පාළු සැපයීමට ඇති පැල සංඛ්‍යාව 100 කට නොඅඩු විය යුතුය. තවද උපරිම පාළු සංඛ්‍යාව අක්කරයකට පාළු පැල 750 (හෙක්ටාරයකට පැළ 1800)ක් නොඉක්මවිය යුතුය.

   සමූහ වශයෙන් පිහිටි පාළු වලට අතිරේකව තනි පාළු පිහිටා තිබේ නම් ඒවා වගාකරු විසින් සම්පූර්ණ කළ යුතු අතර ඒ සඳහා මෙම සහනාධාර මුදල් හිමි නොවේ. මෙම තනිපාළු ප්‍රමාණය ඉතිරි පැල ගණනින් 10% ක් නොඉක්මවිය යුතුය.

4. තේ නැවත හෝ අලුතින් වගා කළ ඉඩමක මෙම ක්‍රමය යටතේ පාළු සැපයීම පිණිස තේ වගා කළ දින සිට යටත් පිරිසෙයින් වර්ෂ 6 ක් ගතව තිබීම හෝ දෙවන වර කප්පාදු කිරීමට සුදානම්ව තිබීම අවශ්‍ය වේ.

5. පාළු සිටුවීමට ඇති බිම් කොටස්වල පාළු සැපයීමට පෙර පස සාරවත් කිරීම පිණිස ගෝතමාලා හෝ මාන තෘණ වගා කර අවම වශයෙන් මාස 18 ක කාලයක් නිර්දේශිත පරිදි තෘණ වගාව නඩත්තු කළ යුතු. අතර නිර්දේශිත පරිදි පස සාරවත් කළ බවට සෙහෙතු පරීක්ෂණයක් මගින් තහවුරු කරගත යුතුය.

6. සතුටුදායක ලෙස පාළු සැපයූ බවට සහ එම පැල සාර්ථක ලෙස වර්ධනය වන බවට සෙහෙතු වාර්තා අනුව තහවුරු කරගෙන පහත සඳහන් පරිදි සහනාධාර මුදල් ගෙවිය යුතුය.

නිර්දේශිත පරිදි පැළ සිටවූ පසුව      පැළයකට රු. 2.50
පැළ සපයා <u>වර්ෂයක්</u> ගතවූ පසුව      පැළයකට රු. 1.50
(සැපයූ පැලවලින් 75%කට අධික
සංඛ්‍යාවක් වයසට අනුව වර්ධනය වී
තිබිය යුතුය.)

7. ඉඩමේ පස සංරක්ෂණ ක්‍රම නඩත්තු කිරීම වගාව පාලනය කිරීම, වැනි අනෙකුත් කෘෂිකාර්මික කටයුතුද සාර්ථක ලෙස ඉටු කර තිබීම අවශ්‍ය වේ.

8. මේ සඳහා භාවිතා කළයුතු වාර්තා සහ ආකෘති පත්‍ර පිළිබඳව විස්තරයක් මේ සමඟ අමුණා ඇත.

9. පැළ සිටුවීම වෙනුවෙන් හිමි කිරීමට අපේක්ෂිත වැඩ කොටස් පිළිබඳව මූලික පරීක්ෂණයේදී සහ එක් එක් වාරික පරීක්ෂණ වලදී ඉල්ලුම්කරු වෙත අවශ්‍ය උපදෙස් දිය යුතුය.

10. මාගේ සමාංක හා 1991.2.14 දිනැති අංක 33 දරණ වගා සහනාධාර චක්‍රලේඛ මඟින් දී ඇති උපදෙස් සහ මීට පෙර මේ සම්බන්ධයෙන් දී ඇති උපදෙස් මේ අනුව නැවත සංශෝධනය කරනු ලබන බව සැළකිය යුතුය.

(ජයන්ත කරුණාතිලක)
සභාපති.

පිටපත් :-

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති)
2. මුදල් කළමනාකරු
3. අභ්‍යන්තර විගණන
4. සහකාර සාමාන්‍යාධිකාරී (පාලන/පිරිස්)
5. සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්.

එස්/2.16.

වගා සහනාධාර චක්‍රලේඛ අංක 40
සඳහා උපලේඛණය.

<u>පාළු සැපයීමේ ආධාර ක්‍රමය සඳහා භාවිතා කළ යුතු වාර්තා සහ ආකෘති පත්‍ර</u>

1. ඉඩමේ සමූහ පාළු පිහිටා ඇති ආකාරය මානක සැලැස්මේ හෝ දළ සටහනක සටහන් කර ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කිරීමට දැනුම් දී ඇත. මූලික පරීක්ෂණයේදී එම සටහන අනුව පරීක්ෂා කර පාළු සිටුවීමට අවසර දෙනු ලබන පැල ගණන නිර්දේශ කළ යුතුය. ඒ අනුව පරීක්ෂක නිලධාරි විසින් එම සටහන නිවැරදි බවට හෝ අවශ්‍ය සංශෝධන සහිතව සහතික කර මූලික පරීක්ෂණ වාර්තාව (එස්වී/4 ආකෘතිය) සමඟ ඉදිරිපත් කළ යුතුය.

ඉල්ලුම් පත්‍ර සමඟ මෙම සටහන සපයා නොමැති නම් අක්කරයක් හෝ ඊට අඩු ඉඩම් වෙනුවෙන් පරීක්ෂක නිලධාරි විසින් එම සටහන සැපයිය යුතුය. අක්කරයකට වැඩි ඉඩම් සඳහා පාළු සපයන පැල ගණන සහිත එවැනි සටහනක් සැපයීමට ඉල්ලුම්කරුට දැනුම් දීමට පුළුවන.

2. පාළු සැපයීම අනුමත කිරීම පිණිස දැනට භාවිතා කරන එස්වී – 6 ආකෘතිය සමඟ <u>අමුණා ඇති</u> කොන්දේසි සහිත ලිපිය නිකුත් කළ යුතුය. එම කොන්දේසි අමුණා ඇති බවට පහත වගන්තිය රබර් මුද්‍රාවක් මගින් එස්වී – 6 ආකෘතියේ සටහන් කළ යුතුය. "<u>මෙම ලිපියේ සහ මීට අමුණා ඇති කොන්දේසිවලට අනුව කටයුතු කර ඉඩම පරීක්ෂා කිරීමට දැනුම් දෙන්න</u>''.

3. සියලුම ගෙවීම් පරීක්ෂණයේදී ද මූලික පරීක්ෂණයේදී පාළු ප්‍රමාණය තීරණය කිරීමට පරීක්ෂණ නිලධාරි තැන විසින් සහතික කර ඉදිරිපත් කරන ලද සටහන යොදා ගත යුතුය. පාළු සහිත එක් එක් බිම් කට්ටිය තුළ සිටුවා ඇති පාළු පැල ගණන එහි සටහන් කළ යුතුය.

4. පරීක්ෂණ සහ අනෙකුත් ලිපිලේඛණ සඳහා කලින් භාවිතා කළ ආකෘතිම යොදා ගැනීමට පුළුවන.

4.1. පස සාරවත් කිරීම පිළිබඳව තොරතුරු දැනීමට ප්‍රථම ක්ෂේත්‍ර පරීක්ෂණයක් පැවැත්විය යුතුය. ඒ සඳහා පරීක්ෂණ වාර්තා ආකෘති පත්‍රය පසුව සපයනු ලැබේ.

4.2. පැල සිටුවා අවුරුද්දකට පසුව දෙවන වාරිකය ගෙවීම පිණිස පවත්වනු ලබන පරීක්ෂණයේදී සිටුවන ලද පැල එම කාල සීමාවට සරිලන පරිදි වර්ධනය වී තිබිය යුතු අතර එසේ වර්ධනය වී තිබේද යන්න දෙවන ගෙවීම් පරීක්ෂණ වාර්තාවේ අදාල ඡේදය යටතේ සඳහන් කළ යුතුය.

පාර පැලවීම අනුමත කරන ලද
SV-5 ලිපියට අමතර වශයෙන්
මෙහි සඳහන් කොන්දේසි බලපැවැත්වේ.

**දුර තෙළුම් තේ ඉඩම්වල පිහිටි තේ පැල**

**සොදා පාර පැලවීමේ ආධාර ක්‍රමය**

**පාර පැලවීම සඳහා කොන්දේසි**

1. පාර පැලවීමෙන් සමුද්‍රායක ඵලය සංවර්ධනය කිරීමට හැකි බිඟ තේ හෝ පිසිලිමත් වගාව සහිත ඉඩම්වලට පමණක් වගාවේ සමුහ වශයෙන් ඇති වූ පාර සපයා ඉවත් කර තාක්ෂණික ක්‍රමයකින් පවත්වා ගෙන යාම සඳහා මෙම සහනාධාර මුදල් ගෙවනු ලැබේ. මේ සඳහා ඉඩමේ දැනට ඉතිරි වී ඇති තේ පඳුරු උසස් තත්ත්වයෙන් පැවතිය යුතු අතර අවම වශයෙන් ඉදිරි අවුරුදු 10 ක කාලය තුලදී නැවත වගා කිරීමට අවශ්‍ය නොවන තත්ත්වයෙන් පවත්වාගෙන යායුතුය.

2. පාර සිටුවීමට ඇති බිම් කට්ටිවල පස සාරවත් කිරීම සඳහා අනුමත ගෝතමාලා හෝ මානා තණ වගා කර අවම වශයෙන් මාස 18 ක කාලයක් තබන්නු කොට පස සාරවත් කලායින් පසුව පාර පැලවිය යුතුය. පාර සපයනු ලබන සියලුම බිම් කට්ටිවල මෙසේ පස සාරවත් කිරීම අනිවාර්යය වේ. මෙම කාලය තුල නිසි පරිදි පොහොර යොදා තණ වගාව නඩත්තු කළයුතු අතර හොඳින් පස සාරවත් වන පරිදි අඩු තරමින් පස්වරක්වත් තණ කපා පස මත අතුරා දැමිය යුතුය.
**<u>මාස 18 කට පසුව ඉඩම පරීක්ෂා කරන අවස්ථාවේදී තණ නොඋදුරා තැබිය යුතුය.</u>**

3. පාර සහිත එක් ස්ථානයක වටත් පිරිසෙයින් පාර පැල 25ක් වත් (වර්ග අඩි 200 ක ප්‍රමාණයේ) යෙදිය යුතුය. තනි ගසිව හෝ වයි ප්‍රමාණයට වඩා අඩුවෙන් ඇති පාර පැලවීම සඳහා මෙම ආධාර හිමි නොවේ.

4. ඉහත පිළිවෙල මත එක ඉඩමක පාර පැලවීමට ඇති උපරිම පැල සංඛ්‍යාව අක්කරයකට පැල 750(හෙක්ටයාරයකට පැල 1800)ක් නොඉක්මවිය යුතුය.එම පදනම අනුව ඔබගේ ඉඩමේ පාර පැලවීම අනුමත කරන ලද පැල ගණනට පමණක් ගෙවීම් කරනු ඇත.සමුහ පාරවලට අතිරේකව තනි පාර පිහිටා තිබේ නම් ඒවා වගාකරු විසින් සම්පූර්ණ කළ යුතු අතර ඊට සහනාධාර මුදල් ගෙවනු නොලැබේ.කෙසේ වුවද තනි පාර ප්‍රමාණය ඉතිරි පැල ගණනින් සියයට 10 ක් නොඉක්මවිය යුතුය.

5. ඉඩමේ පස සංරක්ෂණ ක්‍රම නඩත්තු කිරීම, සෙවන වගාව පාලනය කිරීම, පොහොර යෙදීම, වැනි අනෙකුත් තාක්ෂණික කටයුතු සාර්ථක ලෙස කිරීම අවශ්‍යයි.

6. තණ ඉවත් කිරීමට පෙර, පාර පැලවීමෙන් පසුව සහ පාර සැපයූ පැල වර්ධනය සාර්ථක ලෙස සහතික කිරීමෙන් පසුව යන එක් එක් අවස්ථාවන්හිදී ඉඩම පරීක්ෂා කිරීම පිණිස දැනුම් දීම අවශ්‍යය.

7. මෙම උපදෙස් අනුව වගා කටයුතු කර නොමැති බව පෙනී ගියහොත් සහනාධාර මුදල් හිමි නොවනු ඇත.

ප්‍රාදේශීය කළමනාකරු

5.4 මූලික වාර්තාව පරිදි වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් හරස් පරීක්ෂණ වාර්තාව ලැබීමෙන් පසුව අවසර පත්‍රය යටතේ ඊලඟ ගෙවීමකදී වැඩිපුර ගෙවූ මුදල් අයකර ගත යුතුය. එසේ අය කර ගත නොහැකි අවස්ථාවක් ඇතොත් අවසර පත්‍ර හිමිකරුට එම මුදල ආපසු ගෙවන ලෙස දැනුම්දීම අවශ්‍ය වේ. සාවද්‍ය ලෙස ගෙවීම් නිර්දේශ කළ නිලධාරියාගෙන්ද එකී මුදල අයකර ගැනීම සලකා බැලීම පිණිස මා වෙත වාර්තා කිරීමේදී ඒ පිළිබඳව සටහන් කිරීම අවශ්‍ය වේ.

6.0 මෙම කරුණු සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ උපදෙස් හා ක්‍රියා පිළිවෙත් අහෝසිවූවා සේ සැලකිය යුතු අතර, මින් ඉදිරියට මෙම චක්‍රලේඛයට අදාල කරුණු පමණක් බලපවත්වන බව සැලකිය යුතුය.

මෙම චක්‍රලේඛය ලැබුණු බවත්, ඊ අනුව ක්‍රියා කරන බවත් වාර්තා කළ යුතුය.

(ගයන්ති කරුණාතිලක)
සභාපති.

පිටපත්:-

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ)
2. මුදල් කළමනාකරු
3. අභ්‍යන්තර විගණන
4. සහකාර සාමාන්‍යාධිකාරී (පාලන/මිනි)
5. සහකාර ප්‍රාදේශීය කළමනාකරු (වාණිජ)
6. ප්‍රාදේශීය ක්ෂේත්‍ර නිලධාරීන්
7. සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්.

03/11/22

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

තේ වගා සහනාධාර හරස් පරීක්ෂණ වාර්තාව

---

අ.ප/ඉ.ප.

අංකය:

1. ඉඩමේ නම:-
2. හිමිකරු: ගා.සේ.වගම                    ගම:
3. හරස් පරීක්ෂණයට අදාළ වැඩ අදියර/වාරික ගෙවීම්:
4. නිම කොට ඇල නිම කර ඇති වැඩ කොටස් සහ ඒ පිළිබඳ ඔබගේ නිරීක්ෂණ සවිස්තරව ✱

5. ඉඩම් හිමිකරු /නියෝජිත/ඉඩමේ දී හමුවූ තැනැත්තා විසින් ප්‍රකාශ කරන ලද කරුණු ✱

6. ...ෂේ ...ගත් කරුණු ✱

7. ඉඩමේදී හමුවූ තැනැත්තාගේ නම:
8. නිම කරන ලද වැඩ අදියර වෙනුවෙන් ගෙවීම් කිරීම පිළිබඳ ඔබගේ නිර්දේශ ✱

| නිම වූ වැඩ අදියර | ගෙවීම් කිරීම/ගෙවීම් නිර්දේශ කිරීම | එක් එක් අදියර සඳහා ගෙවීම් නිර්දේශ සාවද්‍ය නම් අඩුපාඩු |
|---|---|---|
| ............ | ............ | ............ |

(මුද්‍රිත ප්‍රතිෂ්ඨාපන වෙනුවෙන් කරන හරස් පරීක්ෂණයක් නම් අවසර පත්‍රය නිකුත් කිරීම පිළිබඳවද වාරික ගෙවීම් පිළිබඳ හරස් පරීක්ෂණයක් නම් අදාල වාරිකය හා කලින් වාරික පිළිබඳවද නිර්දේශ මේ යටතේ සඳහන් කළ යුතුය.)

9. හරස් පරීක්ෂණය පැවැත්වූ දිනය: 19.................. පෙ.ව./ප.ව.:............
10. ඉහත අංක දරන අවසර පත්‍ර/ඉල්ලුම් පත්‍රයට අදාල ඉඩම් කොටස් පිළිබඳව මෙහි සඳහන් විස්තර නිවැරදි බව සහතික කරමි.

හ.ප. පැවැත්වූ නිලධාරිතැනගේ අත්සන.

නම/ තනතුර:

දිනය:-

✱ ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී අනෙක් පිටුව භාවිතා කරන්න.